# පාසල් යාමට කිසිදා වරම් නොලද සම්මානලාභී ලේඛිකාව

ස්වර්ණකාන්ති රාජපක්ෂ



කර්තෘ - රූපා කොඩිතුවක්කු
මුද්‍රණය -
සමයවර්ධන මුද්‍රණාලය
මිල - රුපියල් හතරයි

"ඇගේ භාෂාව හැඟීම් විචිත්‍රණය කිරීමෙහි ලා බෙහෙවින් පිටුබලයක් වී තිබේ. ඇය එම භාෂාව ව්‍යවහාර කරගන්නේ ජීවිතයේ මතුපිට නිරූපණය කර ගැනීමට වඩා එහි අඳුරු කොන්වලට අත පෙවීමටය. "මට විතරද මෙහෙම වුනේ නවකතාව වනාහි විවිධාකාර වූ ආශාවන් සංසිඳුවා ගැනීම සඳහා එහි යම් යම් චරිත විසින් ගන්නා වෑයම මගින් ඔවුන්ගේ මනුෂ්‍යත්වයේ සියුමැලි රටාව භග්න වීමෙන් වේදනා විඳි ආකාරය ඉසමතු කරන අපූරු කෘතියක්ය.




මේ රූපා කොඩිතුවක්කු නම් සුවිශේෂ කතුවරියගේ මට විතරද මෙහෙම වුණේ නමැති නව කතාව පිළිබඳව ප්‍රවීණ සාහිත්‍ය වේදී ධර්මසිරි ගමගේ සූරීන් විසින් පුවත්පතකට ලියන ලද විචාරයකින් උපුටාගන්නා ලද කෙටි සටහනකි. 1971 දී ප්‍රථම වරට පළවූ මෙම නවකතාව 2004 දී දෙවෙනි වරට මුද්‍රණය විය.

අකුරැස්සේ පරදූව නම් සොඳුරු ගම්මානයේ මහමාවතවත්තේ වාසය කරන රූපා කොඩිතුවක්කු ලේඛිකාව උපත ලද්දේ එක්දහස් නමසිය තිස් එක වසරේය. දැනට ඇය අසූ හයවන වියේ පසුවන්නීය.

නිරෝගී බිළිඳියක ලෙස මෙලොව එළිය දුටු ඇය හත්වන මාසයේදී යම් යම් රෝගී ලක්ෂණ පෙන්නුම් කරන්නට වූවාය. සිංහල බෙත් හේත් යාග හෝම වලින් ඇය සුවය නොලද්දීය. 1936 වසරේදී මහ මැතිවරණ ව්‍යාපාරයේ නියැලෙමින් සිටි දිවංගත දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මැතිතුමන්ට ඇය ඇස ගැසුණේ මේ අවධියේය. එතුමා මෙම ප්‍රසන්න දැරියට ඇවැසි ප්‍රතිකාර ලබා දීම සඳහා කොළඹ මහරෝහලට යොමු කළේය. වසර ගණනාවක් තිස්සේ කරන ලද අඛණ්ඩ ප්‍රතිකාර මගින් පක්ෂඝාත රෝගයෙන් මඳ සුවයක් ලබාගත් ඇයට අත්වාරු ලී දෙකකින් ගේ පුරා ඇවිදින්නට තරම් වරම් ලැබුණද පාසල් ජීවිතයේ ආස්ව-ාදය අහිමි විය. එනමුදු අරුමය වූයේ නිවසේ සිය සොයුරු සොයුරියන් ඇසුරින් හෝඩිය හඳුනාගත් ඇය ජීවිතයේ යම් කලෙක විවිධ සම්මාන ලබමින් උපන් ගමට සහ දේශයට පහනක් බඳු වූ දක්ෂ ලේඛිකාවක බවට පත් වීමයි.

වරක් ඇගේ නිවසේ සියලු දෙනා වන්දනා ගමනක් ගියේ පුංචි රූපාගේ තනියට තවත් දෙදෙනෙකු නිවසේ රඳවලාය. මව්පියන් පෙරළා එන විට මේ අපූරු දැරිය මෙවන් කවියක් ලියා තැබුවාය.

මැණිකයි මායි මිසියයි මේ ගෙදර තියා
නිවසේ සැවොම අද මහියංගනේ ගියා
තනි වූ අයුරු දිවැසින් දැක ඇතිව දයා
සෑ රද ඇහැව්වලු "හිච්චා" කොහෙද කියා
(හිච්චා යනු පවුලේ බාලයා වන රූපාය)

අතර හසුවන සෑම පත්තර කරදහියක්ම වැඩි ආශාවෙන් කියවූ රූපා නිවසටම සීමා වූ ජීවිතයක් ගත කළද ඇගේ පරිකල්පන ශක්තිය නම් සීමා මායිම් තිබුණේ නැත. කාව්‍ය මෙන්ම කෙටිකතා, නවකතා, ළමා කතා ඇයගේ පෑන් තුඩින් ගලා ආවේ උතුරමින් ගලාබසින නිල් දිය දහරක් ලෙසින්ය. චන්ද්‍රි ගෙව්වෙමි, ඔබේ දෙනෙතින් සුව ලබන්නම්, මාත් ගැහැනියක්, මා ද නුඹ ද වැරදි කළේ, මතකය අවදි වී, මලක මහිම, මට විතරද මෙහෙම වුණේ, කෙටි හාමිණේ වැනි ජනප්‍රිය නවකතාද කතරක පිපිමල් නම් කෙටිකතා සංග්‍රහයද, සුදු රෙදි හොරා, වැහි කුමාරි වැනි ළමා කතාද ආදී තවත් බොහෝ කෘතීන් හි සාඩම්බර කතුවරිය ඇයයි.

විස්මය ජනක ජීවන චාරිකාවක යෙදී සිටින මෙතුමිය විවිධ සම්මාන හිමිකර ගනිමින් නිසි ඇගැයුම් ලද්දීය. කලා භූෂණ සම්මානය 1985, මාතර දිස්ත්‍රික් කාර්යශූර කාන්තා සම්මානය 1986, කාව්‍ය කීර්ති සම්මානය 1987, මල් ලිය සර 2002, දක්ෂිණ අභිමානී සම්මානය 2005, ජාත්‍යන්තර කාන්තා දිනය 2007, රුහුණු කලා හවුල නාට්‍ය කීර්ති සම්මානය 2009, දක්ෂිණ ලංකා වනිතා ප්‍රණාම 2011, ජ්‍යෙෂ්ඨ ලේඛන ප්‍රණාම 2014, දක්ෂින ප්‍රතිභා 2014, දක්ෂින අභිමානී සම්මානය 2015, ඇතුළු ගෞරව සම්මාන රාශියක් ඇගේ සාහිත්‍ය ජීවිතය එකළු කරන්නේය.



ඔරලෝසු වේලාවට අනුකූලව යන්ත්‍රානුසාරයෙන් මෙන් ගෙවන වත්මන් සංකීර්ණ මිනිස් ජීවිතයට වඩා අතීතයේදී ස්වභාව ධර්මයට ළෙන්ගතුව ගෙවූ චාම් ජීවිතයේ අරුමය සහ අසිරිය නිරන්තරව අගය කළ මෙතුමිය එක කතුවර සටහනක මෙසේ පවසන්නීය. ''ස්වභාව ධර්මයේ නියෝග එසේ නොවේ. කිසිදු බලපෑමක් නැතිවද එම නියෝග ක්‍රියාත්මකය. හෙන්දිරික්කා මල් පිපෙන්නට සැරසෙන වේලාව සවස 4 ය. හෙන්දිරික්කා මල් පිපෙන තෙක් මේ මිහිගැබ ස්වභාව ධර්මයේ නියෝග පිළිපදිනවා ඇත."

මේ සරල සොඳුරු ජීවන දර්ශනය ඇගේ කවි හදවතට නිබඳ ප්‍රබෝධක ආවේගයක් වූවා නිසැකය.

ජීවිතයේ කිසි දිනෙක පාසල් නොගිය රූපාගේ පොත් පත් අද දිවයිනේ බොහෝ පැසල් සහ මහජන පුස්තකාල සරසන්නේය. දැනුම ලබා දෙන්නේය. ආදර්ශය සලසන්නේය. වරක් මේ දිරිය දියණිය තමා විසින් රචිත පොත් පත් අලෙවි කරමින් ත්‍රිරෝද රථයක නැගී දකුණු පළාතේ රජයේ පොසල් හත්දසහසක් කරා ගියාය. දෙපා අහිමි වූවද දිවයිනේ බොහෝ සිද්ධස්ථාන වැඳ පුදා ගත්තාය. එය සිය ජීවිතයේ ලද උතුම්ම සැපත ලෙසින් සලකන ඇය එම පින්කම් සිහිපත් කරමින් ප්‍රීති වන්නීය.

රූපා කොඩිතුවක්කු නම් මේ සුවිශේෂී චරිතය අද ජීවිතයේ සැඳෑ භාගය ගත කරන්නීය. ශරීර සෞඛ්‍යය අතින් අසතුටුදායක ත්තවයක පසුවන ඇයගේ අනුපමේය සාහිත්‍ය සේවාව වෙනුවෙන් අතහිත දීමට සිංහල සාහිත්‍යයට ඇල්ම කරන පරිත්‍යාගශීලීන් යොමුවන්නේ නම් එය ඇයට කරන කෘත ගුණ දැක්වීමකි. ඇය සම්බන්ධ කරගැනීමට ඔබට රිසි නම් ඇගේ ලිපිනය මෙයයි.

රූපා කොඩිතුවක්කු
මහමාවත වත්ත,
පරදූව,
අකුරැස්ස.
දුරකථනය - 041 2283565

එතුමියට නිදුක් නිරෝගී සුව සඳහා ආසිරි පතමු.

